## 1.12 චීන - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ විමර්ශනයක් (අනුරාධපුර යුගය ඇසුරින්)

පූජ්‍ය වැලිමඩගම කුසලධම්ම හිමි,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ශ්‍රී ලංකාව මුල් බුදු දහම පදනම් කොටගත් ථෙරවාද සම්ප්‍රදාය අනුගමනය කරන රටක් වන අතර චීනය මුල් බුදුදහම පදනම් කොට සංවර්ධනයට පත් මහායාන බුදුදහම අනුගමනය කරන රටකි. චීනයට බුදු සමය ක්‍රි.පූ. 2 වන සියවසේ තරම් ඈත යුගයේ ලැබුණු බව වඩාත් පිළිගත් මතය වුවත් එහි බුදු සමයේ සංවර්ධනය සිදු වී ඇත්තේ ක්‍රි.ව. 3, 4 ශත වර්ෂයන්හි දී මහායාන බුදුසමය පදනම් කොටගෙනය. එම නිසා ම චීන - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික සබඳතා මෙම සියවස් වලින් පසුව ආරම්භ වී ඇතැයි නිගමනය කළ හැකිය. මෙම පර්යේෂණය මගින් බලාපොරොත්තු වන්නේ මෙම දෙරට අතර බෞද්ධ සංස්කෘතිය පදනම් කොටගෙන අනුරාධපුර යුගය තුළ සිදු වූ සම්බන්ධතා විමර්ශනය කිරීමයි.

චීන - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික සබඳතාවන්හි ආදිම අවස්ථාව ලෙස ක්‍රි.ව. 411 චීන ජාතික ෆාහියන් භික්ෂුවගේ ශ්‍රී ලංකා සංචාරය වැදගත් වේ. ඉන්පසු ක්‍රි.ව. 420 දී සංඝවර්ම හා ක්‍රි.ව. 425 ගුණභද්‍ර යන ශ්‍රී ලාංකික භික්ෂූන්ගේ චීන ගමන් හා ග්‍රන්ථ පරිවර්තනයනුත්, මහානාම රාජ්‍යවස (ක්‍රි.ව. 410 - 432) ශ්‍රී ලංකාවේ සිට චීන අධිරාජයා වෙත උපාසකවරුන් 04 දෙනෙක් හා ස්තූපයක ආකෘතියක් යැවීමත්, චීන භික්ෂුණී සමාජ පිහිටුවීම සඳහා මෙරට භික්ෂුණී දූත කණ්ඩායම් දෙකක් ගොස් තිබීමත්, ක්‍රි.ව. 522 සිලාකාල රජු චීන රාජ සභාව වෙත මහායාන දහම අදහන පිරිස් අගය කොට වාර්තා කර තිබීමත්, ආදී වශයෙන් පස්වන හා හයවන සියවස් තුළ චීන ලංකා බෞද්ධ සංස්කෘතික සබඳතා පැවත තිබේ.

ක්‍රි.ව. 07 සියවසෙන් පසු හියුං - සාං, භික්ෂුව ඉන්දියාවේ සිට හා ඉට් සිං, අයි හියු මි, මා වෙංටොං යන භික්ෂූන් ශ්‍රී ලංකාවට පැමිණ ලංකාව සම්බන්ධ විස්තර වාර්තා කිරීමත්, ක්‍රි.ව. 08 ශත වර්ෂයේ පුකොං නැමති චීන අධිරාජයාට බලපෑම් කළ ලාංකික භික්ෂුවගේ සංචාරයත්, තාන්ත්‍රික බුදු සමය රැගෙන ශ්‍රී ලංකාවේ සිට වජ්‍රබෝධි හා අමොඝවජ්‍ර යන භික්ෂූන් චීන සංචාරයත්, එම භික්ෂූන් දෙදෙනා සමඟ 37 ක් එම බුදු සමය පිළිබඳ හැදෑරීමට චීන අධිරාජයා විසින් ලංකාවට එවීමත්, ආදී වශයෙන්, දේශාටකයින්, ධර්ම දූතයින්, රාජ්‍ය දූතයින් වශයෙන් ද ථෙරවාද, මහායාන හා තන්ත්‍රයාන යන වර්තමාන ලෝකයේ පවත්නා ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායයන් තුන ම පදනම් කොට චීන ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික සබඳතා පැවැත් වූ ආකාරය පිළිබඳ පර්යේෂණයක යෙදීමට අපේක්ෂා කෙරේ.